# බෞද්ධ - මුස්ලිම් සංවාදය

පොදු මානව ධර්මතා පිළිබඳ බුදුරජාණන් වහන්සේ සහ මුහම්මද් නබිතුමාණන් සමග

ආචාර්ය ආසාද් සිරාස්
ත්‍රිපිටකාචාර්ය රමේෂ් මධුසංඛ



තන්වීර් ආයතනය

බෞද්ධ - මුස්ලිම් සංවාදය | ආචාර්ය ආසාද් සිරාස් - ත්‍රිපිටකාචාර්ය රමේෂ් මධුසංඛ



**අෂ් ෂෙයික් ආචාර්ය ආසාද් සිරාස්** මැලේසියාවේ ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්යවරයෙකි. IIUM වෙතින් උසුල් අල්-දීන් සහ තුලනාත්මක ආගමික අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ගෙන ඇති ඔහු ශ්‍රී ලංකාවේ නළීමියා ඉස්ලාමීය අධ්‍යයන ආයතනයේ උපාධිධාරියෙකි. ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් අරාබි සහ ඉස්ලාමීය අධ්‍යයන පිළිබඳ උපාධියත්, ඉන්දියාවේ මදුරෙයි කාමරාජ් විශ්වවිද්‍යාලයෙන් ආගම සහ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් ලබා ඇත. එසේ ම, ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයෙන් බෞද්ධ අධ්‍යයනය පිළිබඳ තවත් ශාස්ත්‍රපති උපාධියක් ලබා ගෙන ඇති අතර, එම විශ්වවිද්‍යාලයෙන් බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් අත් කර ගත් පළමු ශ්‍රී ලාංකික මුස්ලිම්වරයා ඔහු ය. ස්වකීය පර්යේෂණයන්හි දී බෞද්ධ-මුස්ලිම් අවබෝධය, තුලනාත්මක ආගමික අධ්‍යයනය, අන්තර් ආගමික සංවාදය හා දර්ශනය සහ ඉස්ලාමීය දේවධර්මය වැනි තේමාවන් පිළිබඳ ව ඔහු උනන්දුවක් දක්වයි. සම සමීක්ෂණයට ලක් කෙරෙන ශාස්ත්‍රීය සංග්‍රහයන් කිහිපයක ම ඔහුගේ පර්යේෂණ පත්‍රිකා පළ වී ඇත. ශාස්ත්‍රීය ක්ෂේත්‍රයෙන් ඔබ්බට, ආචාර්ය ආසාද් අන්තර් ලබ්ධි සහ අන්තර් ආගමික මුලපිරීම්හි ක්‍රියාකාරී ව නියැලී සිටින අතර, ඒ සඳහා ශ්‍රී ලංකාවේ සහ මැලේසියාවේ ප්‍රසිද්ධ දේශන, ලේඛන සහ රූපවාහිනී වැඩසටහන් හරහා ඔහුගේ දායකත්වය ලබා දෙයි.



**ත්‍රිපිටකාචාර්ය රමේෂ් මධුසංඛ** මාලිගාකන්ද විද්‍යෝදය පරිවේණස්ථ ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සභාවෙන් සූත්‍ර පිටකය, විනය පිටකය, අභිධර්මය පිටකය යන පිටකත්‍රය සඳහා ම පිළිවෙලින් සද්ධම්මාචරිය, විනයාචරිය, අභිධම්මාචරිය යන උපාධි ත්‍රිත්වය හිමි කර ගෙන ඇති අතර ත්‍රිපිටකාචාර්ය විශ්වවිද්‍යාලයෙන් ද ශාස්ත්‍රවේදී උපාධි ද්විත්වයක් හිමි කර ගෙන ඇති ඔහු බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද සම්පූර්ණ කර ඇති අතර පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකි. බෞද්ධ දර්ශනය හා අභිධර්මය, තුලනාත්මක ආගමික අධ්‍යයනය, භාරතීය දර්ශනය, ග්‍රීක දර්ශනය හා බටහිර සම්භාව්‍ය සංස්කෘතිය, සාහිත්‍යය හා ජනශ්‍රැතිය, ඓතිහාසික පුරාවිද්‍යාව, සාම්ප්‍රදායික සිංහල දැනුම් පද්ධති ආදී තේමාවන් ඔහුගේ පර්යේෂණ අභිරුචීන් වේ. ශාස්ත්‍රීය සංග්‍රහයන් කිහිපයක ම පර්යේෂණ ලිපි පළ කොට ඇති ඔහු ධර්ම සාකච්ඡා, ප්‍රසිද්ධ දේශන, රූපවාහිනී වැඩසටහන්, නව මාධ්‍ය වැඩසටහන් සහ ලේඛන මාධ්‍ය ඔස්සේ ධර්ම ප්‍රචාරයත්, සංස්කෘතික අගනාකම් ඉස්මතු කිරීමත්, සමාජ සහජීවනය හා සංහිඳියාවත් වෙනුවෙන් දායකත්වය දක්වා ඇත.

මිල රු.800.00

ISBN 978-624648004-2

තන්වීර් ආයතනය
481/2, හිජ්රා මාවත, තිහාරිය, නිට්ටඹුව
දුරකථන 033 2297371 / email-tanweeracademy.lk@gmail.com

# බෞද්ධ - මුස්ලිම් සංවාදය

පොදු මානව ධර්මතා පිළිබඳ බුදුරජාණන් වහන්සේ සහ
මුහම්මද් නබිතුමාණන් සමග

**ආචාර්ය ආසාද් සිරාස්**
**ත්‍රිපිටකාචාර්ය රමේෂ් මධුසංඛ**

තන්වීර් ආයතනය

| | | |
|---|---|---|
| මාතෘකාව | : | බෞද්ධ - මුස්ලිම් සංවාදය (පොදු මානව ධර්මතා පිළිබඳ බුදුරජාණන් වහන්සේ සහ මුහම්මද් නබිතුමාණන් සමග) |
| කතුවරු | : | ආසාද් සිරාස් සහ රමේෂ් මධුසංඛ |
| හිමිකම් | : | කතුවරු සහ තන්වීර් ආයතනය |
| පළමු මුද්‍රණය | : | 2025 |
| පිටු සංඛ්‍යාව | : | 204 + xiv |
| ISBN | : | 978 - 624648004 - 2 |
| මිල | : | රු. 1000 |
| පරිගණක පිටු සැකසුම | : | එම්.ආර්.ආර්. අහමඩ් (තන්වීර්) |
| පිටකවර නිර්මාණය | : | එන්. එම්. රෂ්ලි (තන්වීර්) |
| ප්‍රකාශනය | : | තන්වීර් ආයතනය |

# පෙරවදන

**මහාචාර්ය ලෙනගල සිරිනිවාස හිමි**
**සංස්කෘත අධ්‍යයනාංශය,**
**හිටපු පීඨාධිපති - භාෂා අධ්‍යයන පීඨය,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.**

ආචාර්ය ආසාද් සිරාස්ගේ සහ ත්‍රිපිටකාචාර්ය රමේෂ් මධුසංඛගේ "බෞද්ධ - මුස්ලිම් සංවාදය" නම් මෙම කෘතිය කාලීන අවශ්‍යතාවක් ඉටු කරන කෘතියක් බව පෙනේ. එහි අන්තර්ගත කරුණු දෙපාර්ශ්වයේ ම සාමකාමී බවට උපකාර වනු නියත යි. අවබෝධයෙහි අඩුපාඩුකම් නිසා තම ශාස්තෘවරුන් නො දෙසූ දෙයෙහි ආධානග්‍රාහී වී ගැටුම්කාරී වාතාවරණයක් සමාජය තුළ නිර්මාණය වන අයුරු වරින් වර අපට දැක ගත හැකි ය. තම තමාගේ ආගම් සාමකාමී ව ඇදහීමත් පිළිපැදීමත් කළ යුතු අතර අනෙකුත් ආගමිකයින්ට සිතිවිලි මාත්‍රයකින් වත් වෛර නො කළ යුතු ය. එසේ වෛර කිරීමට යම් කිසි ආගමක පවසා තිබේ නම් එය ඇදහිය යුතු ආගමක් නො වේ. එය සමස්ත මිනිස් වර්ගයා විසින් ම ප්‍රතික්ෂේප කළ යුතු ය. එවැනි පොතපත ද ප්‍රතික්ෂේප කළ යුතු ය. ඉතිහාසයේ මිනිසුන්ට වැරදුණු තැන් බොහොමයකි. එම ඓතිහාසික වැරදි නිවැරදි කිරීම අප විසින් කළ යුතු ම වේ. සමස්ත මානව වර්ගයාගේ ම යහපත වෙනුවෙන් විටෙක අපහසුතා මධ්‍යයේ වුවත් තීරණ ගත යුතු ව ඇත. එසේ නො වුණහොත් සමාජය හා රටවල් තව තවත් අනතුරට පත් වනු ඇත. කතුවරුන් දෙදෙනා ගෙන ඇති උත්සහය අතිශයින් ම අගය කළ යුතු වේ. අන්තර්ගත සංසන්දනාත්මක කරුණු සාමකාමී නව ප්‍රවේශයක් ඇති කරන කාලීන ප්‍රස්තුතයන් බව පැහැදිලි ව දක්නට ලැබේ.

ලෝකයේ බොහෝ අර්බුද ඇති වී තිබෙන්නේ අන්‍යෝන්‍ය අවබෝධය නොමැති වීම නිසා ය. මනුෂ්‍යත්වය, සහෝදරත්වය ආගම්

තුළ ඉගැන්වුව ද මිනිස් හදවත් වල එම තත්ත්වය නො සළකා හරින තත්ත්වයක් පවතින්නේ කිසියම් තැනක අඩුපාඩුවක් නිසා ම ය. ආගමික ග්‍රන්ථ, ආගමික ඉගැන්වීම්, අන්තවාදී ක්‍රියාකාරකම් මෙයට බලපා ඇත. ඔවුනොවුන් පරයා යමින් සෙසු ආගමිකයින් සමූල ඝාතනය කරමින් අදහන ආගමේ අර්ථය කුමක් දැ යි වහා වටහා ගත යුතු ව ඇත. මෙම කෘතියෙන් මතු කරන අදහස් සමස්ත සමාජය තුළ ම ව්‍යාප්ත කළ යුතු බව මගේ අදහස යි. එමගින් ආගමික සහනශීලීතාව වර්ධනය වනු නියත යි. මෙම කාර්යය සාර්ථක කර ගැනීමට සහ මෙවන් කෘති තව තවත් රචනා කිරීමට ශක්තිය ලැබේවා යි හදවතින් ම ආශිර්වාද කරමි.

# පෙරවදන

**මහාචාර්ය සමන්ත ඉලංගකෝන්**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශන අධ්‍යයනාංශය,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ආගමික අධ්‍යයනය පිළිබඳ හිටපු මහාචාර්ය.**

නූතන සන්දර්භය තුළ ආගමික නොසන්සුන්තාව තුරන් කිරීම සඳහා වන ඉතා ප්‍රබල ක්‍රමවේදයක් ලෙස අන්තර් ආගමික සංවාදය පත් ව ඇත. වෙනස් ඇදහීම් දෙකක් එකිනෙක හමු වන විට තත්ත්වයන් දෙකකින් එකක් උද්ගත වන්නට ඉඩ ඇත. එකක් නම් ගැටුම්, චෝදනා, අසංවේදී වීම, අධිමානය, අනවබෝධය ආදිය ඇති වීම යි. අනෙක් තත්ත්වය නම් විවිධත්වය සහ ආගමික නිදහස සඳහා වන ගරුත්වය, අවබෝධය සහ සියලු ආගම්වල ගරුත්වය යි.

අන්‍ය ඇදහීම සහ එහි සම්ප්‍රදායන් වඩාත් හොඳින් දැන, එය අගය කිරීමට මෙම සංවාද මාලාව පිහිට වෙයි. ඵලදායී සුහද සංවාදයක් තිබෙන විට අන් ආගම් ගැන ද සුහදශීලී වැටහීමක් ලබා ගන්නට හැකි වන්නේ ය. එවිට සමූහ පැවැත්ම සඳහා අවශ්‍ය ස්ථිර අත්තිවාරමක් ගොඩ නගා ගැනීමට එයට සහභාගිවන්නන්ට මග පාදන අතර විවිධ සම්ප්‍රදායන්වලට අයත් උදවිය අතර මිත්‍රශීලී ක්‍රියාකාරකම් ද උනන්දු කරනු ඇත.

"බෞද්ධ - මුස්ලිම් සංවාදය" (පොදු මානව ධර්මතා පිළිබඳ බුදුරජාණන් වහන්සේ සහ මුහම්මද් නබිතුමාණන් සමග) යැයි නම් කර ඇති ආචාර්ය ආසාද් සිරාස් සහ රමේෂ් මධුසංඛ දෙපළගේ මෙම කෘතිය විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ බෞද්ධ සහ මුස්ලිම් යන සමූහයන් ද්විත්වය විසින් කියවා ප්‍රයෝජන ලැබීමට යෝග්‍ය සම්පාදනයක් ලෙස සඳහන් කළ හැකි ය.

මෙම කතුවරුන් දෙදෙනාව ම මා හොඳින් හඳුනන අතර, මෙම මහතුන් දෙපළ ස්වකීය ඇදහීම් වෙනුවෙන් මෙන් ම ආගම් අතර සුහදත්වයක් ඇති කිරීමට වෙහෙස වන්නෝ වෙති. බුදුරදුන් සහ මුහම්මද්තුමාණන් යන ආගමික ප්‍රධානීන් දෙදෙනා මනුෂ්‍යත්වයේ උන්නතිය සඳහා සිය ජීවිත කැප කළ විශිෂ්ට චරිත දෙකකි.

මෙම ආගමික සම්ප්‍රදායන් දෙකෙහි ම ඓතිහාසික පසුබිම් සැලකිල්ලට ගන්නා කල, එම ඇදහිලි ද්විත්වය ම මිනිස් සංහතියේ යහ පැවැත්ම සඳහා අතිවිශාල මෙහෙයන් ඉටු කර ඇති බවට තර්කයක් තිබිය නො හැකි ය. ඒ අනුව මෙම කෘතිය පොදු ජනතාවට පමණක් නො ව විද්වත් ලොවට ද ප්‍රයෝජනවත් වනු නිසැක ය.

මෙහි දී අවධාරණය කළ යුතු විශේෂ කරුණක් නම් සංවාදය යනු විවාදය නො වන බව යි. විවාදයක් වඩාත් ශාස්ත්‍රීය වූවක් හෝ ගැටුමක එක් තර්කාන්විත ස්වරූපයක් වනු ඇත. තව ද එක් පාර්ශ්වයක් වැරදි යැ යි ඔප්පු කිරීමට තවත් පාර්ශ්වයක් නිර්දය ලෙස තර්ක විතර්ක කිරීම යි. එහි නියැලෙන්නන් තුළ ප්‍රතිවාදි හැඟීමක් ඇති කරනු වැළැක්විය නො හැකි ය. එහෙත් සංවාදය වඩාත් සහයෝගී වන අතර, එහි දී පාර්ශ්ව දෙකක් හෝ වැඩි ගණනක් පොදු අවබෝධයක් වෙනුවෙන් එකට වැඩ කරයි. සංවාදවල දී, එක් පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වයේ දැක්ම පිළිබඳ ව උනන්දු වෙයි. එතුළින් විවෘත මනසකින් යුතු ආකල්ප නිර්මාණය වෙයි. ඒ අනුව සුහදශීලී සංවාද තුළින් තම අධ්‍යයන විෂයයන් තුළ පොදු අවකාශ හඳුනා ගැනීමේ විවෘත මානසිකත්වයක් ඇති කරයි. තවත් ලෙසකින් කියන්නේ නම් සුහද සංවාදයෙහි එක් පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වය පරාජය කරන්නට නො ව, අනෙක් පාර්ශ්වයෙහි සාධනීය කරුණු අධ්‍යයනයට අවකාශය සලසා ගනියි.

ශ්‍රී ලාංකේය සන්දර්භය ගත් කල, අප රටේ ආර්ථික සංවර්ධනයට ඇති ප්‍රධාන බාධාවක් ලෙස අප අතර ප්‍රමාණවත් අන්තර් ආගමික සංවාද නොමැති වීම දැක්විය හැක. මෙය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ අන්‍යයින්ගේ ආගම් පිළිබඳ දැන ගැනීමට ප්‍රමාණවත් ප්‍රවේශ

නොමැතිකම නිසා ය. ශ්‍රී ලංකාවේ සෑම තැනක ම පාහේ බහු ආගමික පැවැත්ම දක්නට ලැබුණ ද, අධ්‍යාපන ක්‍රමය මගින් හෝ බහු ආගමික දැනුම ලබා දීමක් සිදු නො වන අතර මේ සම්බන්ධයෙන් කඩිනම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය වන බව අවධාරණය කළ යුතු ය. එසේ නොමැති නම්, ආගමික ආයතන මගින් වෙනත් ආගමික අනුගාමිකයින් වෙනුවෙන් තමන්ගේ ආගමික ඉගැන්වීම් පැහැදිලි කිරීමේ වැඩසටහන් ආරම්භ කළ හැකි ය. මිනිසුන් අන්‍ය ආගම් ගැන දැන ගැනීමට ඇති හොඳ ම ක්‍රමවේදය වන්නේ එය යි.

ආගමික නිර්මාතෘවරුන් සහ ඔවුන්ගේ පොදු ඉගැන්වීම් තුළින් අන්තර් ආගමික සංවාද ඇති කිරීමට දායක වීම වෙනුවෙන් මෙම කෘතියෙහි කතුවරුන්ට මගේ ප්‍රශංසාව පළ කරමි. මෙය බුදු දහම සහ ඉස්ලාම් ධර්මය පමණක් නො ව අනෙකුත් ආගමික සම්ප්‍රදායන්ට සහ ඒවායේ උගතුන්ට ද පූර්වාදර්ශවත් කටයුත්තකි. ඔවුන්ට ද පොදු කරුණු මත පදනම් ව එවැනි සංවාද ආරම්භ කළ හැකි ය. එබැවින් මෙම ග්‍රන්ථය අන්තර් ආගමික සාමය පිළිබඳ අත්පොතක් ලෙසින් ගෙන, රටේ ස්ථාවරත්වයට දායක වන ලෙස පාඨක ඔබ සැමට මම ආරාධනා කරමි.

# පෙරවදන

**අෂ් ෂෙයික් එම්. ටී. අබ්දුර් රහ්මාන් (නලීමි)**
**ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති (IIUM)**
**අධ්‍යක්ෂ,**
**තන්වීර් ආයතනය**

"සංවාදය" යනු මිනිසුන් හා ප්‍රජාවන් අතර ගෞරවය, අවබෝධය සහ සහයෝගිතාව වර්ධනය කිරීම උදෙසා යොදා ගත හැකි හුදෙක් සාකච්ඡාවකට එහා ගිය ඵලදායී මාධ්‍යයකි. විවිධ සංස්කෘතීන් සහ ආගම් එකට එක් ව සහජීවනයෙන් ජීවත් වන ලෝකයක, සංවාදයේ වැදගත්කම අතිශයෝක්තියක් නො වේ. එය මිනිසුන් එකිනෙකා හා සම්බන්ධ කරමින් තැනෙන පාලමක් සේ පවතිමින් එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට මෙන් ම වෙනස්කම් තුළින් පොදු පදනමක් සොයා ගැනීමට ද ඉඩ සලසාලයි. සංවාද, විශේෂයෙන් ම වැදගත් වන්නේ අන්තර් ආගමික ක්ෂේත්‍රය තුළ වන අතර, එහි අරමුණ වන්නේ විවාද කිරීම හෝ පුද්ගලයින් ව එක් ආගමකින් තවත් ආගමකට හරවා ගැනීම හෝ නො ව එකිනෙකාගේ විශ්වාසයන්, වටිනාකම් සහ වත්පිළිවෙත් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති කර ගැනීම යි.

මෙම සන්දර්භය තුළ, "බෞද්ධ - මුස්ලිම් සංවාදය" (පොදු මානව ධර්මතා පිළිබඳ බුදුරජාණන් වහන්සේ සහ මුහම්මද් නබිතුමාණන් සමග) යන කෘතිය ඉතා වැදගත් හා කාලෝචිත සම්පාදනයක් ලෙස සැලකිය හැකි ය. මෙහි කතුවරුන් වන ආචාර්ය ආසාද් සිරාස් සහ රමේෂ් මධුසංඛ දෙපළ බුදු දහමේ සහ ඉස්ලාම් ආගමේ කේන්ද්‍රීය තේමාවන් හයක් ගවේෂණය කරමින් ඉතා ප්‍රශංසනීය ගමනක් ආරම්භ කර ඇත. මනුෂ්‍යත්වයට ගරු කිරීම, කාන්තාවන්ගේ භූමිකාව, දරුවන් පිළිබඳ දෘෂ්ටි කෝණය, අනෙකුත් ආගමිකයින්ට සැලකීම, සත්ත්ව කරුණාව සහ පරිසර සංරක්ෂණය යන එම තේමාවන් ආගම් දෙකෙහි ම ගැඹුරු දර්ශනයන් හා මගපෙන්වීම්වලින් සමන්විත ක්ෂේත්‍රයන් වේ.

මෙම කෘතියේ සුවිශේෂිතාව වන්නේ එහි කතුවරුන් එකී තේමාවන්ට ලබා දී ඇති ප්‍රවේශය යි. කතුවරුන් ආගමික විෂයෙහි ඇති සංකීර්ණ විවාදාත්මක කරුණුවලින් වැළකී, ඒ වෙනුවට පුළුල් ප්‍රේක්ෂක පිරිසකට ආමන්ත්‍රණය කළ හැකි පැහැදිලි ප්‍රවේශයක් ඉදිරිපත් කිරීමට සමත් වී ඇත. ඔබ වියතෙකු, ආගමික නායකයෙකු, ක්‍රියාකාරිකයෙකු හෝ අන්තර් ආගමික සමගිය වර්ධනය කිරීම කෙරෙහි උනන්දුවක් දක්වන අයෙකු වුව ද, මෙම කෘතිය මගින් ඔබට එදිනෙදා ජීවිතයේ දී යොදා ගත හැකි ප්‍රායෝගික ඥානයන් ලබා දෙයි. එසේ ම, අන්තර් ආගමික සංවාද සඳහා අත් පොතක් ලෙස භාවිත කළ හැකි මෙය සංස්කෘතික හා ආගමික බෙදීම් යා කරන පාලමක් ලෙස කටයුතු කරමින් අර්ථවත් සංවාදවල යෙදීමට අවශ්‍ය මෙවලම් පාඨකයින්ට සපයයි.

බෞද්ධයින් සහ මුස්ලිම්වරුන් සමාන පුරවැසියන් ලෙස සහජීවනයෙන් ජීවත් වන දේශයන්හි අන්තර් ආගමික සංවාදය වැරදි අර්ථකථනයන්ට හා වටහා ගැනීම්වලට ලක් වූ අවස්ථාවන් ද තිබී ඇති පසුබිමක, මෙම කෘතිය අන්තර් ආගමික සංවාදය පිළිබඳ අද්විතීය දෘෂ්ටිකෝණයක් සපයයි. අවංක භාවයෙන් හා විවෘත භාවයෙන් යුතු ව සංවාදයට එළඹෙන විට, එය ගැඹුරු අවබෝධයකට සහ සහයෝගිතාවකට මග පාදන ආකාරය මෙයින් මනා ව පිළිබිඹු වේ. පොදු වටිනාකම් හා සදාචාරාත්මක මූලධර්ම කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, බෞද්ධයින්ට සහ මුස්ලිම්වරුන්ට වඩාත් විවෘත හා දයානුකම්පිත සමාජයක් නිර්මාණය කිරීම සඳහා එක් ව වැඩ කළ හැකි බව කතුවරු පෙන්වා දෙති.

ඉස්ලාම් සහ අනෙකුත් ආගමික සම්ප්‍රදායන් අතර ඇති ආවේණික වටිනාකම් අනාවරණය කර, ප්‍රවර්ධනය කිරීමේ අපගේ දැක්මට පරිපූර්ණ ලෙස සමගාමී වන බැවින්, මෙම විශිෂ්ට කෘතිය ප්‍රකාශයට පත් කිරීමට ලැබීම ඉස්ලාමීය අධ්‍යයන සහ අන්තර් ආගමික අවබෝධතාව සඳහා වන අප ආයතනයට ගෞරවයකි. මෙම කෘතිය ප්‍රකාශනයට පත් කිරීමෙන්, ප්‍රජාවන් අතර අඛණ්ඩ ව පවතින සංවාදයට දායක වීමටත්

අන්තර් ආගමික අවබෝධය පෝෂණය කිරීමේ අපගේ උත්සාහය ඉදිරියටත් අඛණ්ඩ ව කරගෙන යාමටත් අපි කැප වී සිටිමු.

එබැවින්, මෙම කෘතිය හරහා "සංවාද" යනු හුදෙක් තම තමන්ගේ ආගම් හුවා දැක්වීමේ මාධ්‍යයක් ලෙස නො ව, එකිනෙකාගෙන් ඉගෙන ගැනීමටත්, අන්‍යෝන්‍ය ගෞරවය හා අවබෝධය මත පදනම් වූ අනාගතයක් ගොඩනැගීමටත් යොදා ගත හැකි මාධ්‍යයක් ලෙස බෞද්ධ හා මුස්ලිම් පාඨකයින් තුළ පෙළඹවීමක් ඇති කරවනු ඇතැ යි අපි විශ්වාස කරමු. එසේ ම, විවිධත්වයෙන් යුතු වූ අන්‍යෝන්‍ය අන්තර් සම්බන්ධතාවන්ගෙන් පිරුණු ලෝකයක සාමය සහ එකමුතුකම ප්‍රවර්ධනය කිරීමේ උත්සාහයට මෙම කෘතිය සාධනීය දායකත්වයක් සපයයි. එබැවින් විවිධ ආගමික විශ්වාසයන් අතර සම්බන්ධතා ශක්තිමත් කර, කල් පවත්නා සම්බන්ධතා ගොඩනගා ගැනීමේ අපේක්ෂාවෙන්, අනාගතයේදී ද තවත් මෙවැනි මුලපිරීම් සඳහා සහාය වීමට අපි බලාපොරොත්තු වෙමු.

# හැඳින්වීම

"බෞද්ධ - මුස්ලිම් සංවාදය" (පොදු මානව ධර්මතා පිළිබඳ බුදුරජාණන් වහන්සේ සහ මුහම්මද් නබිතුමාණන් සමග) නමැති මෙම කෘතිය සම්පාදනය කිරීම මගින් අපි අපේක්ෂා සහගත ශාස්ත්‍රීය හා සමාජීය ගමනකට මුල පුරා ඇත්තෙමු. පුළුල් ගරු බුහුමනට පාත්‍ර ව ඇති ආගමික ඇදහීම් දෙකක් අතර අවබෝධය සහ එකමුතු බව ප්‍රවර්ධනය කිරීමේ පොදු දැක්මකින් යුතු ව අපගේ විශ්වාස සහ දැනුම ඒකාබද්ධ කරන්නට මෙම සාමූහික ප්‍රයත්නය හරහා අපි උත්සාහ කර ඇත්තෙමු.

මෙම කෘතිය තුළින් බුදුරජාණන් වහන්සේ සහ මුහම්මද්තුමාණන්ගේ ජීවිත හා ඉගැන්වීම් පිළිබඳ ගැඹුරු ගවේෂණයක් ආරම්භ කරන මෙන් විද්වතුන් ඇතුළු සියලු පාඨකයින්ට අපි ආරාධනා කරමු. මනුෂ්‍යත්වයේ පටන් පරිසරවේදය දක්වා වන ඔවුන්ගේ දැක්ම සූක්ෂ්ම ලෙස සහ අවංක ව මෙහි පිළිබිඹු කර ඇති අතර, ඒ හරහා මෙම උදාර චරිත ද්විත්වයේ ඉගැන්වීම් සමගාමී වේදිකාවක තබා සලකා බැලෙන පොදු තේමා වෙත පාඨකයින්ගේ අවධානය ගෙනෙනු කැමැත්තෙමු.

මෙම කෘතියේ කතුවරුන් වන අපි දෙදෙනා, අප විශ්වාස කරන ධර්මයන් හොඳින් අනුගමනය කරන්නන් වශයෙන්, බෞද්ධ හා මුස්ලිම් සමූහයා අතර සුහද සංවාද සහ අන්‍යෝන්‍ය ගෞරවය වර්ධනය කිරීමේ වැදගත්කම ද මනා ව හඳුනා ගෙන ඇත්තෙමු. මෙම ග්‍රන්ථය මගින් අන්තර් ආගමික අවබෝධයේ සංකීර්ණතා අභිභවා යාම සඳහා වන මාර්ග සිතියමක් ද පාඨකයින්ට ලබා දෙන අතර, මෙය අර්ථවත් ආගමික, දාර්ශනික, සාමාජික හා සංස්කෘතික සංවාදවලට මග පාදනු ඇතැ යි අපි බලාපොරොත්තු වෙමු.

මෙම පොතෙහි පරිච්ඡේදවල දක්නට ඇත්තේ හුදෙක් අපගේ ආගමික මතවාදයන් පමණක් නො ව, ඊට සමගාමී ව අපගේ සහයෝගිතාවේ සහ සාමූහික අධ්‍යයනයේ ශක්තිය විදහා දක්වන

ප්‍රබල සාක්ෂි ද වේ. මෙහි ඇතුළත් සෑම පරිච්ඡේදයක් ම අදාළ එක් එක් තේමාවෙහි විශේෂත්වය ගවේෂණය කරමින් ආරම්භ වන අතර, එහි අදාළතාව ඉස්මතු කරන්නට වැදගත් උපුටා දැක්වීම් මෙන් ම ප්‍රායෝගික උදාහරණවලින් ද මෙය සමන්විත ය.

බුදුරජාණන් වහන්සේ මෙන් ම මුහම්මද්තුමාණන් වෙත ඉදිරිපත් කරන උපකල්පිත ප්‍රශ්න ස්වරූපයෙන් අරඹා ඇති මෙම සංවාද මාලාව හරහා එම උදාර පුරුෂයින්ගේ ඉගැන්වීම් සමග ඍජු ව සම්බන්ධ වීමට අපි පාඨකයින් ව දිරිමත් කර ඇත්තෙමු. මෙමගින් අපගේ පොදු මානුෂීය අත්දැකීම්වල ගැබ් ව ඇති සාරවත් විවිධත්වය ගැඹුරු ලෙසින් අගය කරන්නට ද අපි පාඨකයා උනන්දු කරන්නෙමු.

ලෝකය තුළ අන්තර් ආගමික සුහදතාව සඳහා වන ප්‍රාරම්භක පියවර දැනටමත් දක්නට ලැබෙන අතර, මෙම කෘතිය ඒ උදෙසා තබනු ලබන විමර්ශනශීලී සහ අවබෝධාත්මක එක් කුඩා පියවරක් ලෙස පිළිගැනෙනු ඇතැ යි අපි විශ්වාස කරමු. තව ද මෙම කෘතිය මගින් ආරම්භ කරන සෑම සංවාදයක් ම සංවේදීභාවය, දයානුකම්පාව සහ අන්‍යෝන්‍ය ගෞරවය රජ කරන ලොවකට අපව වඩාත් සමීප කරනු ඇතැ යි අපට හැඟෙන හෙයින් අපි ඒ පිළිබඳ ශුභවාදී හැඟීම්ලින් යුතු ව සිටින්නෙමු.

මෙම අත් පොත කියවීමෙන් එකිනෙකා අතර අවබෝධය සහ සාමය සාක්ෂාත් කර ගැනීමේ මාධ්‍යයක් ලෙස සුහද සංවාදය යොදා ගැනීම උදෙසා ඔබ දිරි ගැන්වෙනු ඇතැ යි අපි බලාපොරොත්තු වෙමු. වඩාත් සාමකාමී සහ අන්තර්කරණය වූ සමාජයක් (inclusive society) නිර්මාණය කිරීම සඳහා එකිනෙකාගේ අනන්‍යතාවලට ගරු කරමින්, වෙනස්කම් අභිභවමින් එක්සත්භාවයේ සහ සහයෝගිතාවේ පාලම් තැනීමට අපි අත්වැල් බැඳ ගනිමු.

මෙම කෘතිය සඳහා අගනා පූර්විකාවන් සපයා දුන් මහාචාර්ය ලෙනගල සිරිනිවාස ස්වාමීන් වහන්සේ, මහාචාර්ය සමන්ත ඉලංගකෝන් මැතිතුමා සහ අෂ්. එම්. ටී. අබ්දුර් රහ්මාන් (නලීම්) මැතිතුමා යන විද්වතුන්ට අපගේ විශේෂ ස්තුතිය පිරිනමන අතර

මෙම කෘතිය ප්‍රකාශනයට පත් කිරීමේ වගකීම භාර ගත් තන්වීර් ආයතනයටත්, ග්‍රන්ථයේ නිමැවුම් කටයුතු සඳහා සහාය ලබා දුන් සිතුමිණි චාතුර්යාටත්, ෂෙකා සෙයිනබ්ටත්, ඉංග්‍රීසි මුල් පිටපතේ ඉස්ලාමීය කරුණු සිංහල බසට පරිවර්තනය කිරීමෙහි දී විවිධ අයුරින් සහාය වූ ජෙම් සලීම්ටත් අපගේ ස්තුතිය පුද කරන්නෙමු. එසේ ම අපගේ මව්පිය, ඥාති හිතමිතුරු, ගුරු භවතුන් මෙන් ම මෙවන් පර්යේෂණ කටයුතු සඳහා නිරන්තරයෙන් අප දිරි ගන්වන සියලු දෙනා ද මෙහි දී කෘතඥතා පූර්වක ව සිහි කළ යුතු ය.

**ආසාද් සිරාස් සහ රමේෂ් මධුසංඛ**
**2025/11/05**

# පටුන


- පෙරවදන iii
- හැඳින්වීම xi

1. බෞද්ධ - මුස්ලිම් සංවාදය 1
2. බුදුරජාණන් වහන්සේ සහ මුහම්මද් නබිතුමාණෝ 31
3. මනුෂ්‍යත්වය පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ සහ මුහම්මද් නබිතුමාණන්ගේ ඉගැන්වීම් 66
4. කාන්තාවන් පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ සහ මුහම්මද් නබිතුමාණන්ගේ ඉගැන්වීම් 100
5. දරුවන් පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ සහ මුහම්මද් නබිතුමාණන්ගේ ඉගැන්වීම් 120
6. අනෙකුත් ආගමිකයින් පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ සහ මුහම්මද් නබිතුමාණන්ගේ ඉගැන්වීම් 136
7. සතුන් පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ සහ මුහම්මද් නබිතුමාණන්ගේ ඉගැන්වීම් 151
8. පරිසරය පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ සහ මුහම්මද් නබිතුමාණන්ගේ ඉගැන්වීම් 162

- ආශ්‍රිත ග්‍රන්ථ නාම ලේඛනය 198

# නිගමනය

බුදුරජාණන් වහන්සේ සහ නබි මුහම්මද්තුමාණන් සමග වන උපකල්පිත සංවාද මාලාවක් මත පදනම් වූ මෙම කෘතිය බුදු දහම සහ ඉස්ලාම් දහම යන දෙකට ම කේන්ද්‍රීය වන මනුෂ්‍යත්වය සම්බන්ධ ඉගැන්වීම්, කාන්තාවන් හා දරුවන් පිළිබඳ දෘෂ්ටිකෝණය, අනෙකුත් ආගමිකයින් සමග ඇසුර, සතුන් පිළිබඳ ආකල්ප සහ පරිසර සංරක්ෂණය යන ප්‍රධාන තේමා හයක් යටතේ මූලික ගවේෂණයක් ඉදිරිපත් කර ඇත. මෙම තේමාවන් කෙරෙහි අවධානය යොමු කිරීම හරහා බෞද්ධයින් සහ මුස්ලිම්වරුන් අතර ගැඹුරු අවබෝධයක් සහ අන්‍යෝන්‍ය ගෞරවයක් ප්‍රවර්ධනය කරමින් මෙම ආගමික සම්ප්‍රදායන් ද්විත්වයෙහි මතු කෙරෙන සාමූහික අගයන් සහ සදාචාරාත්මක මූලධර්ම ආදිය ඉස්මතු කරන්නට මෙම කෘතිය වෑයම් කර තිබේ.

පුළුල් පාඨක පරාසයක් වෙනුවෙන් සැලසුම් කර ඇති මෙම සම්පාදනය විද්වතුන්ට, සිවිල් ක්‍රියාකාරීන්ට සහ ආගමික ප්‍රධානීන්ට එක සේ ප්‍රයෝජනවත් විය හැකි ය. තව ද මෙම කෘතිය අන්තර් ආගමික සංවාදයට උනන්දුවක් දක්වන ඕනෑ ම අයෙකුට පරිශීලනය කළ හැකි වටිනා සම්පතක් බවට පත් කරන්නට අපි උත්සාහ කර ඇත්තෙමු.

මෙම කෘතිය හුදු පර්යේෂණ මත පදනම් වූවක් පමණක් ම නො වන අතර, එය සෑම කෙනෙකුට ම ඇසුරු කළ හැකි පාඨක-හිතකාමී වූවක් ද වේ. අප විසින් චේතාන්විත ව ම සංකීර්ණ දාර්ශනික වාද විවාද සහ මෙම කෘතියේ තේමාවන්ට ඍජු ව ම අදාළ නො වන ආගමික තර්ක විතර්ක මගහැර ඇති අතර, ඒ වෙනුවට කරුණු කාරණා ඍජු ව ඉදිරිපත් කරමින් සැමට සංවාදයට ඇරයුම් කරන ආකාරයෙන් මෙය සකසා ඇත. මෙය බෞද්ධ සහ ඉස්ලාම් යන ආගමික සම්ප්‍රදායන් ද්විත්වයෙහි ම පාඨකයන්ට පරිශීලනය කළ හැකි බව සහතික කරන අතර ඔවුන්ට එදිනෙදා ජීවිතයේ දී අදාළ කර ගත හැකි ප්‍රායෝගික අවබෝධයක් සහ චින්තනමය පසුතලයක් ද මෙමගින් ලබා දෙයි.

මෙම කෘතිය, අධ්‍යාපනය පමණක් නො ව බෞද්ධ - මුස්ලිම් අන්තර් ආගමික වැඩසටහන් සහ සංවාදයන් සඳහා අත් පොතක්

ලෙස ද යොදා ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ. විවේචනාත්මක කරුණු සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේගේ සහ මුහම්මද්තුමාගේ සිතුවිලි සහ ඉගැන්වීම් ඉදිරිපත් කිරීමෙන්, මෙම ග්‍රන්ථය පාඨකයන්ට ඇදහිලි දෙකක් අතර ඇති පොදු පරාස ගැන සිතා බැලීමටත් සංස්කෘතික හා ආගමික බෙදීම් සමනය කරන අර්ථවත් සංවාදවල යෙදීමටත් රුකුලක් වනු ඇතැ යි ද අපි විශ්වාස කරමු.

මෙම ග්‍රන්ථය බෞද්ධ - මුස්ලිම් පසුබිම් දෙකෙහි ම පාඨකයන්ට සහයෝගීතාවේ සහ සහජීවනයේ ආකල්පයන් වර්ධනය කර ගැනීමට උපකාරී වනු ඇත යන්න අපගේ තවත් බලාපොරොත්තුවකි. ඉහත ආගමික සම්ප්‍රදායන්හි ශ්‍රේෂ්ඨ නායකයින් දෙදෙනාගේ වටිනාකම් අවබෝධ කර ගැනීමෙන් සහ අගය කිරීමෙන්, පාඨකයන්ට වඩාත් අන්තර් ක්‍රියාකාරී සහ මිත්‍රශීලී ලොවක් බිහි කර ගැනීමට එක් ව කටයුතු කළ හැකි ය.

ඒ අනුව, විවිධත්වය අගයන අන්තර් සම්බන්ධිත ලොවක අවබෝධයේ පාලම් තැනීමට සහ සාමය හා සමගිය ප්‍රවර්ධනය කිරීමට අන්තර් ආගමික සංවාදයකට ඇති විභවය පිළිබඳ ප්‍රකාශනයක් ලෙස පාඨකයා විසින් මෙම කෘතිය පිළිගනු ලබයි නම් එය අපගේ මෙම උත්සාහය සාර්ථක වූ බවට නිසැක සාක්ෂියක් වනු ඇත.

# References

01. A. P. de Soysa, "Tripitakaya, Anguttara Nikaya", S. Godage Publishers, 2015

02. A. P. de Soysa, "Tripitakaya, Digha Nikaya 3", S. Godage Publishers, 2015

03. A. R. M Imtiyaz, "The Easter Sunday Bombings Muslims," Journal of Asian and African Studies, 2020, https://doi org/10.1177/0021909619868244.

04. Abbasi, Maryam Ajilian, Masumeh Saeidi, Gholamreza Khademi and Bibi Leila Hoseini.
"Child Maltreatment in the World: A Review Article." International Journal of Pediatrics 3 (2015): 353-365.

05. Abu-Munshar, Maher Y, "In the shadow of the 'Arab Spring': the fate of non-Muslims under Islamist rule." Islam and Christian–Muslim Relations 23 (2012): 487 - 503.

06. Anguttara Nikaya, Part II, IV and V, 2006, Buddhist Cultural Centre.

07. Appleton, Naomi. "In the Footsteps of the Buddha? Women and the Bodhisatta Path in Theravā?Da Buddhism." Journal of Feminist Studies in Religion 27, no. 1 (2011): 33–51.
https://doi.org/10.2979 jfemistudreli.27.1.33.

08. Azwar Azwar, Abur Hamdi Usman and Mohd Farid Ravi Abdullah, Preserving the Earth: Perspectives on Prophetic Hadiths, Preserving the Earth: Perspectives on Prophetic Hadiths | HADIS (kuis.edu.my) Benjamin Schonthal, "The Impossibility of a Buddhist State," Asian Journal of Law and Society 3, no. 1 (2016): 29–48, https://doi. org/10.1017/als.2016.

09. Benjamin Wormald, "Women in Society," Pew Research Center's Religion & Public Life Project (blog), April 30, 2013, https://www. pewresearch org/ religion/2013/04/30/the-worlds-muslims-religion-politics society women -in-society/.

10. Browne, F. W. Stella. "The Rights of Animals." (2011).

11. Chulla Vagga Pali, Part II, 2006, Buddhist Cultural Centre

12. Cynthia D. Trone, A Buddhist Perspective on the Global Environmental Crisis: Poetics of the Wild

13. Davidoff, Donald J. "Animal Rights: Selected Resources and Suggestions for Further Study." Reference Services Review 17 (1989): 71-82.

14. Dhammapada Attha-Katha, Part I, Tripitaka Publication Press, 2005
15. Digha Nikaya, Part I, II and III, 2006, Buddhist Cultural Centre
16. Deena Robinson, "The Biggest Environmental Problems Of 2021," Earth. Org, June 24, 2023, https://earthorg.mystagingwebsite.com/ the-biggest-environmental-problems-of-our-lifetime/ Dhammapada Dheega Nikaya, Part I, II,III Brahmajala Sutta, 2006, Buddhist Cultural Centre
18. Esposito, John L, "Islam." In the Oxford Encyclopedia of the Islamic World, edited by J. L. Esposito. (Oxford: Oxford University Press 2009)
19. Fabio, A. D. (2016). Buddhism and Human Rights. www.unipd-centro-dirittiumani.it.https://unipd-centrodirittiumani.it/en/schede/Buddhism-and-Human-Rights/399
20. Fraschl, Pamela D, "Addressing Animal Abuse: The Complementary Roles of Religion, Secular Ethics, and the Law." Society & Animals 8 (2000): 331-348.
21. Global Issues: Gender Equality and Women's Empowerment," accessed August 9, 2023, https://www.peacecorps.gov/educators/ resources/ global-issues-gender-equality-and- womensempowerment/.
22. Gunn, Giles B, "The Interpretation of Otherness: Literature, Religion, and the American Imagination." (1979).
23. Hadith, Sunnah.com. https://sunnah.com/bukhari:13. Hamdzah, Hazwani and Raudlotul Firdaus Fatah Yasin. "Child abuse in Malaysia: an overview from an Islamic perspective." (2016).
24. Have, Henk ten and Maria do Céu Patrão Neves. "Animal Rights (See Animal Ethics; Animal Research; Animal Welfare; Vegetarianism; Zoocentrism)." Dictionary of Global Bioethics (2021).
25. Hubbard, Jamie. "Buddhist-Buddhist Dialogue? The "Lotus Sutra" and the Polemic of Accommodation." Buddhist–Christian Studies 15 (1995): 119.
26. Jamal Badawi, Status of Women in Islam
27. James John Stewart, "Muslim–Buddhist Conflict in Contemporary Sri Lanka," South Asia Research 34, no. 3 (2014): 241–60, https://doi.org/10.1177/0262728014549134
28. Jataka Pali, Part I, 2006, Buddhist Cultural Centre
29. Jatakattha-Katha, Part IV, Tripitaka Publication Press, 2008
30. Johan (Yang Bin) Elverskog, "Buddhism and Islam on the Silk Road,"

Buddhism and Islam on the Silk Road (Book Review) 95 (2010): 1–340, https://doi.org/10.1080/09596410.2013.732268.

31. Juichiro Tanabe, “Buddhism and Peace Theory: Exploring a Buddhist Inner Peace.” International Journal of Peace Studies, 2016, 21: 14.
32. K. Jayatilleke, The Buddhist Attitude to Other Religions (Sri Lanka: Buddhist Publication Society, 1975)
33. King, Sallie B., ‘Buddhism and, in John Witte
34. Khuddaka Nikaya, Part I, Dhammapada Pali, Government of Ceylon, 1960
35. Kuddhaka Nikaya, Apadana Pali, Part I (2), 2006, Buddhist Cultural Centre
36. Kuddhaka Nikaya, Sutta Nipatha, 2006, Buddhist Cultural Centre
37. Kumar, Shravan. “Teachings of Buddha: A Solution to Modern World Problems.” (2006).
38. Lama Thubten Yeshe. (2014). When We Study Buddhism, We Study Ourselves. www.fpmt.org. https://fpmt.org/mandala/ archives/older/mandala-issues for-1998/january/when-we-study-buddhism-we studyo urselves
39. London Buddhist Vihara, (n.d.), Pre-Buddhist Indian History, www.londonbuddhistvihara.org. https://www.londonbuddhistvi- hara.org/teachings/pre-buddhist-indian-history/
40. M. Christian Green (eds), Religion and Human Rights: An Introduction (New York, 2011; online edn, Oxford Academic, 24 Mar. 2015),
41. https://doi.org/10.1093/acprof:osobl/9780199733453.003.0006
42. Mahavaggapali, Part I,II and III, 2006, Buddhist Cultural Centre
43. Mahawana, S. Godage & Brothers, 1996, pg. 2, 3
44. Majjhima Nikaya, Part I, II and III, 2006, Buddhist Cultural Centre
45. Manorathapurani or the Commentary on the Anguttara Nikaya, Part I, 1923, Somawathi Hewavitarane Board of Trust
46. Mahinda Palihawadana, The Theravada Analysis of Conflicts, In Buddhism, Conflict and Violence in Modern Sri Lanka, 83–93. Routledge. https://doi.org/10.4324/9780203007365-13.
47. Michael Hart in “The 100, A Ranking of the Most Influential Per- sons in History,” New York, 1978

48. Mohamed Ashath, “Peaceful Coexistence Through the Concepts of Brahmavihārās of Buddhism and Maqāid Al-Sharīa of Islam: A Content Analysis,” Analisa: Journal of Social Science and Religion 6, no. 01 (2021): 1– 16, https://doi.org/10.18784/analisa. v6i01.1298.

49. Mohamed Ashath, Fathuma Afra and Nur Suriya Binti Mohd Nor (2024) “Buddhist-Muslim Understanding on Protection of Life Through the Concepts of Buddhist Pāātipāta and Islamic Hifz al-Nafs: A Textual Analysis”, al-Afhar, Journal For Islamic Studies, 7(3), pp. 269–289. Doi: 10.31943/afharjournal.v7i3.1341

50. Mohammed Ashath and Nur Suria Mohd Nor, “Social Cohesion in the Views of Islam and Buddhism: A Textual Analysis,” Al-Itqān, no. 2 (2021)

51. Muhammad Yasin Mazhar Siddiqui, The Prophet Muhammad: A Role Model for Muslim Minorities, The Islamic Foundation (Leicester, 2006)

52. Negin Vaghefi, Chamhuri Siwar, and Sarah Aziz Abdul Ghani Aziz, “Green Economy: Issues, Approach and Challenges in Muslim Countries,” Theoretical Economics Letters 05, no. 01 (January 13, 2015): 28, https://doi.org/10.4236/tel.2015.51006.

53. Nehginpao Kipgen, “Addressing the Rohingya Problem,” Journal of Asian and African Studies 49, no. 2 (2014): 234–47, https://doi.org/10.1177/0021909613505269

54. Nine Key Issues Affecting Girls and Women Around the World,” Global Citizen, June 4, 2015, https://www.globalcitizen.org/en/ content/9-key-issues-affecting-girls-and-women-around-the/.

55. Olendzki, A. (n.d.). Metta Sutta. BCBS. https://www.buddhistin- quiry.org/article/metta-sutta/

56. Pachitthiya Pali, Part I, 2006, Buddhist Cultural Centre

57. Paek, Do-su and Sunhee Kim. “A Study of the Buddhist Mission by the Action of the Buddha.” Asia-Pacific Journal of Convergent Research Interchange (2021).

58. Peter D Santina, Fundamentals of Buddhism (Singapore: Buddha Dharma Education Association Inc., 1984); Bukkyo Dendo Kyokai, The Teaching of Buddha (Tokyo: Kosaido Co., Ltd, 2005), 42.

59. Pintu Kumar, “The Ancient Nālandā Mahāvihāra: The Beginning of Institutional Education,” The Journal of the World Universities Forum 4, no. 1 (2011): 65–80,

https://doi.org/10.18848/1835-2030/cgp/v04i01/56731

60. Piyadasa Nishshanka, " Manusmruthi alias Manawa Dharma Shasthraya", S. Godage, 1991
61. Riyad as-Salihin
62. Robinson,"Pollution and Waste in Thailand," accessed August 6, 2023, https://rpl.hds.harvard.edu/religioncontext/case-studies/ climate-
63. Roloff, Carola, "Openness towards the Religious Other in Bud- dhism." Buddhist Responses to Religious Diversity: Theravāda and Tibetan Perspectives (2020).
64. Rothberg, Donald Jay. "Buddhist Responses to Violence and War." Journal of Humanistic Psychology 32 (1992): 41- 75.
65. S. Sarawad, Shivaleela. "Child Abuse – A Review Article." International Journal of Advances in Nursing Management (2022)
66. Saeed, Riaz Ahmad, Sumayyah Rafique, Naseem Akhter, Zahid Lateef, Abu Bakar Bhutta, and Hafiz Muhammad Yasir Naeem. "Prophet Muhammad (PBUH) Practices to Establish a Pluralistic Society: Study of Madīnah Charter in Contemporary Global Context." Journal of Cultural and Religious Studies 6 (2018).
67. Samyuktha Nikaya, Part I, III, V, V(II), 2006, Buddhist Cultural Centre
68. Silva, D G Harendra de and Harendra de Silva. "Children needing protection: experience from South Asia." Archives of Disease in Childhood 92 (2007): 931 - 934.
69. Singala Sutta Vannana of Digha Nikaya Attakatha, 1925, The Tripitaka Publication Press
70. Status of Women before Islam (islamweb.net).
71. Thera Gatha Attha-Katha, Part II, Tripitaka Publication Press, 2005
72. The Story of (Part 1) 27—the Story of Poor Sopaka, https://www.buddhanet.net/e-learning/buddhism/lifebuddha/27lbud.htm.
73. U. D. J. Jinadasa, "Religions Around the World", Sarasavi Publishers, 2011
74. United Nations. (n.d.). Universal Declaration of Human Rights | United Nations.
https://www.un.org/en/about-us/universal-declaration-of human-rights
75. University of Buffalo. (n.d.). Buddhism: Theravada: Primary Texts. www.research.lib.buffalo.edu. https://research.lib.buffalo. edu/buddhism/

theravada-primary-texts

76. Ven. Balangoda Ananda Maithreya Thero, Shakyamunindrawadanaya alias Siddhartha Gauthama Buddha Charithaya, 2000
77. Vinaya Attha-Katha, Part II, Tripitaka Publication Press, 2000
78. Visuddhi Magga, 2006, The Tripitaka Publicaion Press
79. Walpola Sri Rahula, What the Buddha Thought (New York: Grove Press, 1974)
80. What are some important Theravada texts? - Buddhism for Beginners. (2020, April 25). Buddhism for Beginners. https:// tricycle.org/beginners/ buddhism/important-theravada-texts/
81. You Must Know This Man: Muhammad (The Ideal Prophet)’. Accessed 31 March 2024. https://www.iium.edu.my/deed/articles/muhammad.html